# තොරතුරු අයිතිය නීතිගත වීම පිළිබද ජාත්‍යන්තර ඉතිහාසය

**<u>පසුබිම-</u>**

තොරතුරු අයිතිය, තොරතුරු නිදහස හා තොරතුරු සඳහා ඇති ප්‍රවේශය එකිනෙකට තරමක් සමාන එහෙත් වෙනස් සංකල්ප තුනකි. තොරතුරු අයිතියේ ඉතිහාසය පිළිබදව සාකච්ඡා කිරීමේදී මෙම සංකල්ප තුනම එකක් ලෙස ගෙන සාකච්ඡා කරනු ලැබේ.

"ජනතාවට ඇති තොරතුරු අයිතිය රජය මගින් පිළිගැනීම පිළිබද ඉතිහාසය" මෙන්ම "තොරතුරු අයිතිය පිලිබද නීති සම්මත වීමේ ඉතිහාසය" ද එකිනෙකට වෙනස් වේ.

තොරතුරු අයිතිය මානව අයිතිවාසිකමක් ලෙස පිළිගැනීමද, තොරතුරු අයිතිය පිළිබද නීති සම්පාදනයද එකිනෙකට වෙනස් වේ.

තොරතුරු අයිතිය පළිබද ඉතිහාසය පිළිබද කරුණු හැදැරීමේදී මෙම සියලු කරුණු පිළිබදව සාකච්ඡා කළ යුතුය.

**<u>ජනතාවගේ තොරතුරු අයිතිය පිළිගැනීම-</u>**

රජයක් විසින් ජනතාවගේ තොරතුරු අයිතිය පිළිගැනීම පිලිබදව මුල්ම සාක්ෂි හමුවන්නේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස තරම් ඈත ඉතිහාසයෙනි. ඒ ඉන්දියාවේ රජකම් කළ අශෝක අධිරාජ්‍යයාගේ යුගයෙනි. අශෝක අධිරාජ්‍යයා විසින් තම රාජ්‍ය පාලනය සඳහා භාවිතා කරන ලද නීතිරීති හා ජනතාවට අවශ්‍යවන රජයේ තොරතුරු ශිලා ස්ථම්භ මත ලියා තම රාජ්‍යයේ ප්‍රධාන ස්ථානවල ප්‍රදර්ශනය කර ඇත. අශෝක ස්ථම්භ ලෙස පුරා විද්‍යාඥයින් විසින් සලකුණු ලබන්නේ මෙම රාජ්‍ය තොරතුරු සහිත ගල් කුළුණුය. එම කුළුණුවල සදහන් තොරතුරු කියවා ගැනීමට නොහැකි පුරවැසියන් වෙනුවෙන් තොරතුරු විස්තර කිරීම සඳහා රාජ පුර්ෂයන් එම කුළුණු අසල යොදවා සිටි බවද ඉතිහාසයේ සදහන් වේ. මේ අනුව තොරතුරු අයිතිය පිළිබඳ ඉතිහාසය ආරම්භවන්නේ බටහිර රටවලින් නොව පෙරදිග රාජ්‍ය තුළිනි.

**<u>තොරතුරු අයිතිය නීතිගත වීම-</u>**

පුරවැසියන් සතු තොරතුරු අයිතිය නීතිගත වූ පළමු අවස්ථාව ලෙස සලකන්නේ ස්වීඩන් පාර්ලිමේන්තුව පුවත් පත් සඳහා ලිවීමේ නිදහස පිළිබඳ පනත( The Ordinance on freedom of Writing and of the Press) සම්මත සම්මත කිරීමත් සමඟය. මෙම පනත හඳුන්වාදෙන ලද්දේ පූජකවරයකු මෙන්ම ස්වීඩන් පාර්ලිමේන්තුවේ සභිකයකු වූ ඇන්ඩර්ස් සයිඩෙනිස් (Anders Chydenius) විසිනි. එකල ස්වීඩනය තුළ පාර්ලිමේන්තුවක් මෙන්ම රජතුමෙක්ද පාලන කටයුතු සිදුකළ අතර මෙම පනත පාර්ලිමේන්තුවට ගෙන එන ලද්දේ **ඇඩොල්ෆ් පෙඩ්‍රික් රජ** සමයේදීය. මෙම පනතේ පරමාර්ථය පුවත්පත්වල නිදහස ආරක්ෂා කිරීම වුවද, පනතේ අන්තර්ගතය අනුව ලොව මුල්ම තොරතුරු ලබාගැනීමේ නිදහස පිළිබඳ නීතිය මෙම පනත බව පිළිගැනීමට ලක්වී ඇත.

ලොව දෙවන තොරතුරු අයිතිය පිළිබඳ පනත ලෙස සලකන්නේ ෆින්ලන්තය විසින් සම්මත කරන ලද ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වල විවෘතභාවය පිළිබඳ පනත(Act on the Openness of Government Activities) නැමති නීතියයි. ඒ 1951 වසරේදීය.

ලොව තුන්වනවරට සම්මත කළ තොරතුරු අයිතිවාසිකම් පනතට හිමිකම් කියන්නේ ඇමරිකා එක්සත් ජනපදයයි. ඒ 1966 වසරේදී සම්මත කරන ලද තොරතුරු නිදහස පිළිබඳ පනතයි.
ඉන් පසුව 1970 වසරේදී නෝර්වේ හා ඩෙන්මාර්කය තොරතුරු අයිතිවාසිකම් පනත් සම්මත කරන ලද අතර 1978 වසරේදී නෙදර්ලන්තයද තොරතුරු පනතක් සම්මත කරයි.
1980 දශකය වන තෙක්ම ලොව තොරතුරු පනත් සම්මත වූයේ ඉතා අල්ප වශයෙන් බව මේ අනුව පැහැදිලිය.
ලොව තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ විශාල පිබිදීමක් ඇති වන්නේ 1990 හා 2000 දශක දෙකක කාලය තුළදීය. නමුත් දකුණු ආසියාවේ තොරතුරු අයිතිවාසිකම් පනත් සම්මත වන්නේ 2000 වසරෙන් පසුවය.
මේ වනවිට ලොව රටවල් 117ක් [1] තොරතුරු අයිතිවාසිකම් පිලිබද නීති සම්මත කරගෙන ඇති අතර තවත් රටවල් 44ක් තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ නීති සම්මත කරගැනීමට උත්සාහ කරමින් සිටියි.[2]
එමෙන්ම ලෝක ජනගහනයෙන් 86 % ජීවත් වන්නේ තොරතුරු අයිතිවාසිකම් නීති මගින් සහතික කල රටවල්වලය[3].

**<u>දකුණු ආසියාවේ තොරතුරු අයිතිවාකම් නීති සම්මත වීම</u>**

සාර්ක් කලාපයේ රටවල් තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ පනත් සම්මත කිරීම ආරම්භ වන්නේ 2000 දශකයෙන් පසුවය. ඒ අනුව පහත සඳහන් පරිදී

- පකිස්ථානය-2002 වර්ෂයේදී තොරතුරු නිදහස පිලිබද ආඥාපනත( Freedom of Information Ordinance) සම්මත කරන ලදී
- ඉංදියාව- 2005 වර්ෂයේදී ඉන්දීය මධ්‍යම ආණ්ඩුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කරන ලදී.(සමහර ප්‍රාන්ත ආණ්ඩු එයට පෙර තොරතුරු පනත් සම්මත කර තිබිණි)
- නේපාලය-2007 වර්ෂයේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කරන ලදී
- බංගලිදේශය-2009 වර්ෂයේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කරන ලදී
- මාලදිවයින-2014 වර්ෂයේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කරන ලදී
- ඇෆ්ගනිස්ථානය-2014 වර්ෂයේදී තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ නීතිය(ACCESS TO INFORMATION LAW) සම්මත කරන ලදී.
- ශ්‍රී ලංකාව- 2016 වර්ෂයේදී තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කරන ලදී.

---

[1] http://www.rti-rating.org/country-data/
[2] Open Development-Access to Information and the Sustainable Development Goals-July 2017

[3] https://www.article19.org/resources.php/resource/38833/en/new-report-examines-the-links-between-the-right-to-information-and-fighting-poverty

- භූතානය- මෙතෙක් තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ නීතියක් නීතිගත කර නොමැත. නමුත් 2014 වර්ෂයේදී පනත් කෙටුම්පතක් පළමු මන්ත්‍රී මණ්ඩලය (National Assembly) සම්මත කරන ලද නමුත් උත්තර මන්ත්‍රී මණ්ඩලය (Upper House) විසින් එකී පනත ප්‍රතික්ෂේප කරන ලදී.[4]

**<u>ඉන්දියාවේ තොරතුරු අයිතිය නීතිගත වීම</u>**

ඉන්දියාව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සාකච්ඡාවට දිගු ඉතිහාසයක් ඇත. තොරතුරු අයිතිය නීතිගත කිරීම පිළිබඳ ඉන්දීය ඉතිහාසය ආරම්භ වන්නේ 1977 වසරේදී අගමැති මොරාජ් දේශායි විසින් ජනතාවගේ තොරතුරු අයිතිය සහතික කිරීම පිණිස රාජ්‍ය නිල රහස් පනත සංශෝධනය කිරීම පිණිස කමිටුවක් පත් කිරීමත් සමගය. පසුව ඉංදීය ශ්‍රේෂ්ඨාධිකරණය 1986 වසරේදී <u>කල්වාල්</u> එදිරිව <u>ජායිපූර් මහ නගරසභා සංස්ථාව</u> නැමති නඩුවේදී ප්‍රකාශ කලේ ඉන්දීය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19 වන වගන්තියේ සඳහන් භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම යටතට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමද ඇතුළත් වන බවයි. 1990 වසරේදී වී.පී.සිංන්ග් අගමැතිතුමාගේ ජාතික පෙරමුණු ආණ්ඩුව තොරතුරු අයිතිය පිළිබඳ පනතක් ගෙන ඒමට උත්සාහ කළ නමුත් පැවති දේශපාලන අස්ථාවරත්වය නිසා එය යථාර්තයක් බවට පත් කිරීමට නොහැකි විය.

තොරතුරු අයිතිය නීතිගත කිරීම සඳහා සිවිල් සංවිධාන ක්‍රියාකාරීත්වයක් සංවිධානාත්මක ලෙස ආරම්භ වන්නේ 1994 වසරේදීය. ඒ රාජස්ථාන් ප්‍රාන්තය මුල්කරගෙන බිහිවන මන්දූර් කිෂන් ශක්ති සංගතන් (MKKS ) නැමති සංවිධානයයි. ඒ සඳහා නායකත්වය ලබාදෙන්නේ අරුණා රෝයි මහත්මියයි.1994 වසරේදී විසින් තොරතුරු පනත් කෙටුම්පතක් සම්පාදනය කරන ලදී. 1996 වසරේදී සියලු සිවිල් ක්‍රියාකාරීන් එක්වී "ජනතාවගේ තොරතුරු අයිතිය සඳහා ජාතික ව්‍යාපාරය (National Campaign for People's Right to Information-NCPRI)"බිහිකර ගන්නා ලදී. එම වසරේදීම ඉන්දීය පුවත්පත් මණ්ඩලය එහි සභාපති ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පී.එස්.සවාන්ඩ් ගේ මෙහෙයවීම මත තොරතුරු නිදහස පිළිබඳ පනතක් කෙටුම්පත් කරන ලදී.

1997 වසරේදී තමිල්නාඩු ප්‍රාන්ත ව්‍යවස්ථාදායක සභාව විසින් තොරතුරු අයිතිය පිළිබඳ පනතක් සම්මත කළ අතර එය ඉන්දියාවේ ප්‍රාන්තයක් සම්මත කළ පළමු තොරතුරු පනත විය. එම වසරේදීම ගෝවා ප්‍රාන්තයද තොරතුරු අයිතිය පිළිබඳ පනතක් සම්මත කරන ලදී. මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්තය විධායක නියෝගයක් නිකුත් කරමින් තමන් යටතේ පවතින දෙපාර්තමේන්තු 36ක තොරතුරු ලබාගැනීම ජනතාව විවෘත කරන ලදී. ප්‍රාන්ත මට්ටමින් මෙම කටයුතු සිදුවෙද්දී එම වසරේදීම මධ්‍යම රජය විසින් තොරතුරු අයිතිය පිළිබඳ පනතක් කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී.

1999 වසරේදී තොරතුරු අයිතිය පිළිබඳ පනතක් ගෙන එන ලෙස ආණ්ඩුවට බලකරමින් මහජන අර්ථ සිද්ධි නඩු කර ඉංදීය ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුවිය.

අවසානයේදී 2005 වසරේ මැයි 11 වන දින ලෝක් සභාවද මැයි 12 වන දින රාජ්‍ය සභාවද ඉන්දීය තොරතුරු පනත සම්මත කරන ලදී.[5]

---

[4] https://www.pressreader.com/bhutan/business-bhutan/20161126/281543700529056

[5] http://rtiact2005.com/history-of-rti-act-2005-in-india-evolution-and-challenges/

**<u>තොරතුරු අයිතිය තහවුරුකළ ජාත්‍යන්තර ලේඛණ</u>**

තොරතුරු අයිතිය පුරවැසි අයිතියක් මෙන්ම මානව අයිතියක්ද වේ එම නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන මගින් එළිදක්වන ලද මානව හිමිකම් ලේඛණවලද තොරතුරු අයිතිය සහතික කර ඇත. ප්‍රධාන පෙළේ මානව හිමිකම් ලේඛණයන්හි තොරතුරු අයිතිය සහතික කර ඇති ආකාරය පහත පරිදී සාකච්ඡා කළ හැකිය.

**මානව හිමිකම් විශ්ව ප්‍රකාශය-1948**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දෙසැම්බර් 10 වන දින සම්මත කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශයේ 19 වන ව්‍යවස්ථාවේ තොරතුරු අයිතිය පිළිබඳව මෙසේ සදහන් වේ.

*"තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත. අනුන්ගේ බාධාවක් නොමැතිව තම මතය දැරීමට දේශ සීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් ඇති අයිතියද ඊට ඇතුළත් ය.:*

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය-1966**

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1996 වසරේදී සම්මත කරන ලද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 19 වන ව්‍යවස්ථාවේ සාමාජික රාජ්‍යයන්ගේ පුරවැසියන් සතු තොරතුරු අයිතිය පිළිබඳව මෙසේ සදහන් වේ.

*"1. බාධාවකින් තොරව ස්වකීය මතය දැරීමට සෑම කෙනෙකුටම අයිතිවාසිකම් ඇත්තේය.*
*2. සෑම කෙනෙකුටම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇත්තේය. දේශ සීමාවන්ගෙන් තොරව තොරතුරු, සෑම අන්දමකට අදහස් වාචිකව, ලිඛිතව හෝ මුද්‍රිතවද, චිත්‍රවල ආකාරයෙන් ද එසේ නැතහොත් තමාට කැමති වෙනත් ඕනෑම මාධ්‍යයකින් ද සොයා ගැනීමට, ලැබීමට සහ දැන්වීමට තිබෙන නිදහස මෙම අයිතිවාසිකමට ඇතුළත් විය යුතුය.*
*මෙම වගන්තියේ 2 වන ජේදයෙහි ප්‍රතිපාදිත අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම විශේෂ රාජකාරී හා වගකීම් හා සම්බන්ධව පවතී. එසේ හෙයින් එය ඇතැම් සීමාකිරීම්වලට යටත්විය හැකි නමුත් එම සීමාකිරීම:*
*(අ) අනික් අයගේ අයිතිවාසිකම් වලට හා කීර්ති නාමයන්ට ගරු කිරීම සඳහා,*
*(ආ) ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය හෝ මහජන සෞඛ්‍ය හා සදාචාරය හෝ රැකීම සඳහා,නීතියෙහි ලා විධිවිධාන සලසා ඇත්තා වූ ද අවශ්‍ය වන්නා වූ ද ඒවා විය යුතුය."*

මේ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිය භුක්ති විදීමේදී එය යම් යම් සීමාවන්ට යටත්ව භුක්ති විදිය යුතු බව පැහැදිලිය.

**<u>සමාප්තිය-</u>**

මේ අනුව තොරතුරු නීතියට දිගු ඉතිහාසයක් පවතින බවත්, දකුණු ආසියාවේ මෙම නීති සම්මත වීම 2000 වසරෙන් පසුව සිදුවී ඇති බවද පැහැදිලිය, කෙසේ නමුත් අප රට තොරතුරු අයිතිය තහවුරු කළ 111 වන රට බවට පත්වේ.

**නීතිඥ ජගත් ලියන ආරච්චි**